**මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතිය - 2011**

-----------------------------------------------------------------

1. **මතය.**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**.

2.1 **මූල්‍ය කාර්යය සාධනය.**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.156,106,867 ක් වූ අතර, 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.168,228,162 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, 2010 අප්‍රේල් 09 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම සහ 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2010 අප්‍රේල් 09 සිට දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2010 | 2009 | |
| | රු. | රු. | රු. |
| යන්ත්‍ර සහ උපකරණ | 5,914,686 | 2,924,579 | 8,839,265 |
| සමාජමය සැහැල්ලු කිරීම | 805,120 | -- | 805,120 |
| උපදේශක සේවා ගාස්තු | 122,271,042 | -- | 122,271,042 |
| වර්ධන පිරිවැය | 13,359,051 | 2,443,185 | 15,802,236 |
| ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ මූල්‍ය ගාස්තු | 13,756,968 | 6,753,531 | 20,510,499 |
| | 156,106,867 | 12,121,295 | 168,228,162 |

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම.

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, විශේෂ මෙහෙයුම් හා සාමාන්‍ය මෙහෙයුම් සඳහා වෙනම අග්‍රිම අරමුදල් ගිණුම් 02 ක් විවෘත කර තිබණි. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුම් දෙකෙහි මෙහෙයුම් හා එදිනට එම ගිණුම් දෙකෙහි පැවති ශේෂය පහත දැක්වේ.

### (අ) ආ.ස.බැ. ණය අංක 2557 - එස්ආර්අයි එස්එල් 140 (සාමාන්‍ය මෙහෙයුම්)

| විස්තරය | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| ආරම්භක තැන්පතුව | 200,000 | 22,038,620 |
| එකතු කළා | | |
| විදේශ විනිමය වාසිය | -- | 741,640 |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 200,000 | 22,780,260 |

### (ආ) ආ.ස.බැ. ණය අංක 2558 - එස්ආර්අයි එස්එල් 141 (විශේෂ මෙහෙයුම්)

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 112,086 | 12,436,241 |
| එකතු කළා | | |
| ඌන පූරණයන් | 176,115 | 19,762,790 |
| | 288,201 | 32,199,031 |
| අඩු කළා | | |
| ආපසු ගැනීම් | 259,948 | 28,926,171 |
| විදේශ විනිමය පාඩුව | -- | 54,764 |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 28,253 | 3,218,096 |

3. <u>විගණන නිරීක්ෂණ</u>.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ විස්තරාත්මක වැඩ සැලැස්ම අනුව, 2012 තුන්වැනි කාර්තුවේ සිට ආසියානු සංවර්ධන බැංකුවේ අතිරේක සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත්වලින් අරමුදල් උපයෝජනය කිරීමට සැළසුම් කර තිබුණ ද, රු.13,231,458 ක් වූ බැදීම් ගාස්තු තුන් වැනි කාර්තුව ආරම්භ වීමට පෙර 2010 අගෝස්තු 15 සිට 2011 අගොස්තු 14 දක්වා ගෙවා තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ සංරචක 05 ක් සඳහා 2011 වර්ෂයේ අයවැය ලේඛනයෙහි රු. මිලියන 735 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණ ද, රු. මිලියන 207 ක් එනම්, ප්‍රතිපාදනයෙන් 28% ක් පමණක් සමාලෝචිත වර්ෂයේ උපයෝජනය කර තිබුණි. අරමුදල් ඌන උපයෝජිත අවස්ථා ප්‍රතිපාදන සමඟ සසඳා පහත දැක්වේ.

| | | විෂයය | ප්‍රතිපාදිත මුදල | 2011 දෙසැම්බර් 31 දිනට තථ්‍ය වියදම | ඌන උපයෝජිත මුදල |
|---|---|---|---|---|---|
| | | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 1 | | **මලාපවහන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.** | | | |
| | 1.1 | සවි නොකරන ලද උපකරණ කොළඹ මහ නගර සභාව සඳහා සැපයීම. (Jetting Machine) | 260 | 0.78 | 259 |
| | 1.2 | මුහුදු මෝය (Sea Outfall) පුනරුත්ථාපනය. | 249 | නැත | 249 |
| | 1.3 | නැවත පදිංචි කිරීමේ කටයුතු. | 02 | 0.805 | 1,195 |
| 2 | | **ආයතනික හා මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම.** | | | |
| | 2.2 | ආයතනික සහාය සඳහා උපකරණ | 03 | නැත | 03 |
| | 2.3 | ධාරිතා සංවර්ධනය | 05 | නැත | 05 |
| 3 | | **ව්‍යාපෘති කළමනාකරණය හා ක්‍රියාත්මක කිරීමේ සහාය.** | | | |
| | 3.3 | පුහුණු හා වැඩමුළු | 01 | නැත | 01 |

(ඇ) වටිනාකම රු.14,440,851 ක් වූ ස්ථාවර වත්කම් සඳහා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වර්ෂය අවසානයේ පැවැත්වියයුතු භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඈ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම තහවුරු කර ගනු වස් සමස්ථ ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි ඉලක්කයන් සඳහා වගකීම් නියම කර මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වමින් විස්තරාත්මක ක්‍රියාකාර සැලැස්මක් ව්‍යාපෘති මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර සකස් කළයුතු වුවත්, එවැනි සැළැස්මක් 2012 ජුලි 09 දක්වා පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි.